## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා පුරප්පාඩු පිරවීම

# සාමාන්‍යාධිකාරී HM 2-1 "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" සේවා ගණය - තනතුරු 01 කි

### සුදුසුකම්

### බාහිර අයදුම්කරුවන්

1. කළමනාකරණ, සිවිල් ඉංජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

**සමඟ**

කළමනාකරණය, ඉංජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලාබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) හෝ වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ (SLIA) (Chartered Engineer/ Chartered Architects) සම්පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර විස්සක (20) ක පළපුරුද්ද ලබා තිබීම. අවම වශයෙන් මින් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

**හෝ**

2. කළමනාකරණය, සිවිල් ඉජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**සමඟ**

කළමනාකරණය, ඉංජිනේරු, වාස්තු විද්‍යාව හෝ නීති යන විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

**සහ**

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද

### අභ්‍යන්තර අයදුම්කරුවන්

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සමඟ**

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාවය.

**වැටුප :** HM 2-1 - රු.91,645 - 12x2,700 = 124,045

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- ඉන්ධන දීමනාව සමග නිල රථයක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් ලැබෙනු ඇත.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

**වයස :** අවුරුදු 35ට නො අඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

### තනතුරට අදාළ පොදු කොන්දේසි

**සෑම අයදුම්කරුවෙකුම,**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද, සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
5. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
6. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
7. අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

### අයදුම් කළ යුතු ආකාරය

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි **සාමාන්‍යාධිකාරී තනතුරට බඳවා ගැනීම** යනුවෙන් සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2024.02.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ hr@cma.lk දරන email (විද්‍යුත් තැපෑල) ලිපිනයට එවිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 2.**